# නිවැරදිව හා ප්‍රවේසම් සහගතව ප්‍රතිජීවක භාවිත කිරීම සඳහා ඔබ අපට අවශ්‍යයි.

ගොවිපල් හිමියන්

ප්‍රතිජීවක යනු සතුන්ගේ සහ මිනිසුන්ගේ රෝග, ආසාදන තත්ව පාලනය කිරීමට හා ප්‍රතිකාර කිරීමට අත්‍යාවශ්‍ය ඖෂධ වේ.

නමුත් ඒවායේ ක්‍රියාකාරී කාර්යක්ෂමතාව ඉතා ශීඝ්‍රයෙන් පහළ වැටෙමින් පවතී.

## ඔබ දැනගත යුතු දේ

- මෙම වටිනා ඖෂධ නිවැරදි ආකාරයෙන් භාවිත නොකිරීම නිසා, රෝග කාරකයින් ඊට එරෙහිව ප්‍රතිරෝධය ගොඩනඟා ගැනීම ශීඝ්‍රයෙන් ඉහළ යමින් පවතී. බැක්ටීරියා, ප්‍රතිජීවකවලට ප්‍රතිරෝධී වූ විට, ඒවායේ ක්‍රියාකාරී කාර්යක්ෂමතාව හීන වන අතර ඒවාට තවදුරටත් රෝගවලට එරෙහිව ක්‍රියා කළ නො හැක. ප්‍රතිජීවක ප්‍රතිරෝධීතාවය ලෙස හඳුන්වන්නේ මෙම සංසිද්ධිය යි.

- ප්‍රතිජීවක ප්‍රතිරෝධීතාව ජලයේ හා ගොඩබිම වාසය කරන සියලුම සතුන්ගේ හා මිනිසුන්ගේ සෞඛ්‍යට හා සුබසාධනයට දැඩි තර්ජනයකි. එනමුත් පවත්නා ප්‍රතිජීවකවලට එරෙහි ප්‍රතිරෝධය ඉහළ යන ශීඝ්‍රතාවය, නව ප්‍රතිජීවක නිෂ්පාදනය වන ශීඝ්‍රතාවයට වඩා ඉතා ඉහළ ය. එබැවින් දැනට පවතින ඖෂධ රැකගැනීම ඉතා වැදගත් වී ඇත.

- ලෝක සත්ව සෞඛ්‍ය සංවිධානයේ අන්තර් රාජ්‍ය ප්‍රමිතීන්ට අනුව, මිනිසුන්ගේ හා සතුන්ගේ සෞඛ්‍ය පවත්වා ගෙන යාම සඳහා, මෙම අනර්ඝ ඖෂධ වගකීමෙන් හා නිවැරදි ලෙස භාවිත කිරීමෙන්, ඒවායේ ක්‍රියාකාරී කාර්යක්ෂමතාව හා පැවැත්ම ආරක්ෂා කරගත හැක.

**ඔබ අපට අවශ්‍යයි!**

“අප සියලු දෙනාට ම කළ යුතු කාර්යයක් ඇත. විශේෂයෙන්, **සත්ව පාලන ගොවීන් හා ගොවිපල් හිමියන් ලෙස** ඔබට ද මේ සඳහා දායක විය හැක.”



- ප්‍රතිජීවක වල පැවැත්ම හා ක්‍රියාකාරී කාර්යක්ෂමතාව රැකගැනිම සඳහා ඒවායේ නිවැරදි සහ වගකීම් සහගත භාවිතය තහවුරු කළ යුතු අතර, එමගින් මිනිසුන්ගේ හා සතුන්ගේ සෞඛ්‍ය හා සුභසාධනය ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතු ය. එමෙන් ම යහපත් සත්ව පාලන ක්‍රමවේද, මනා ජෛව ආරක්ෂණ හා සනීපාරක්ෂණ උපක්‍රම සහ එන්නත් සඳහා ප්‍රමුඛතාවය ලබාදීමෙන් සතුන්ගේ සෞඛ්‍ය තත්වය ඉහළ මට්ටමකින් පවත්වා ගෙන යා හැක.

- රෝගකාරකවල ප්‍රතිජීවකවලට එරෙහි ප්‍රතිරෝධය මැඩලීම ලෝක සත්ව සෞඛ්‍ය සංවිධානයේ ප්‍රමුඛ අරමුණක් වී ඇත. සත්ව පාලනයේ නියුතු ගොවීන් හා ගොවිපල් හිමියන් ඇතුළු සියලුම සත්ව සෞඛ්‍ය පිළිබඳ කටයුතු කරන අංශ ලෝක සත්ව සෞඛ්‍ය සංවිධානයේ අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුව වගකීමෙන් හා නිවැරදි ආකාරයට, මිනිසුන්ගේ හා සතුන්ගේ සෞඛ්‍ය හා සුභසාධනය ඉහළ නැංවීම උදෙසා මෙම ඖෂධ භාවිත කරනු දැකීම එම සංවිධානයේ අපේක්ෂාව වේ.

වැඩිදුර තොරතුරු සඳහා : www.oie.int/amrstandards

# සත්ව නිෂ්පාදන ක්ෂේත්‍රයේ ගොවිපල් හිමියනි, නිෂ්පාදකයා ඔබයි




- ප්‍රෝටීන ආහාර නිෂ්පාදනය කරන ගොවි මහත්ම මහත්මීන් ලෙස ලෝකයට පෝෂණය සැපයීම සඳහා ඔබ මහඟු මෙහෙවරක් කරමින් සිටී. එබැවින් ගොවිපල සතුන්ගේ සෞඛ්‍ය හා සුබසාධනය රැකගනිමින් ආරක්ෂිත හා සනීපාරක්ෂිත සත්ව නිෂ්පාදන පාරිභෝගිකයින් වෙත සැපයීම ඔබගේ වගකීමකි.

- සත්ව සෞඛ්‍ය හා සුබසාධනය වැඩි දියුණු කිරීම අරමුණු කර ගත් ගොවිපල් ක්‍රම හා නිර්දේශ ක්‍රියාත්මක කරමින්, ප්‍රතිජීවක ප්‍රතිරෝධීතාවය ඇතිවීම හා පැතිරීම වැළැක්වෙන හා අඩු වන අයුරින් කටයුතු කිරීම නිවැරදි හා වගකීම් සහගත ප්‍රතිජීවක භාවිතය යන්නෙන් අදහස් කෙරේ.

## ගොවිපල හිමියන් දැනගත යුතු කරුණු

1. පශු වෛද්‍යවරයෙකුගේ උපදෙස් මත පමණක් ප්‍රතිජීවක භාවිත කරන්න. (සෑම ආසාදනයකට ම / රෝගයකට ම ප්‍රතිජීවක වර්ග භාවිත කිරීම අවශ්‍ය නොවේ.)

2. පශු වෛද්‍යවරයා නිර්දේශ කර ඇති නියමිත මාත්‍රාව පිළිබඳ උපදෙස් අනුව පමණක් මෙම ඖෂධ ඔබගේ සතුන්ට ලබාදීමට කටයුතු කරන්න.

3. සෑමවිට ම පශු වෛද්‍යවරයා නිර්දේශ කර ඇති කාලය පුරාවට ම මෙම ඖෂධ ලබාදීමට කටයුතු කරන්න. (සතුන් ඉක්මනින් සුව වී ඇති බව පෙන්නුම් කළ ද පශු වෛද්‍යවරයා නිර්දේශ කර ඇති කාලය අවසන් වන තෙක් ම ඖෂධ ලබාදීමට කටයුතු කරන්න.)

4. බලයලත් ආයතනවලින් පමණක් ප්‍රතිජීවක මිල දී ගැනීමට කටයුතු කරන්න.

5. ගොවිපලෙහි යහපත් සත්ව පාලන, ජෛව ආරක්ෂණ හා කළමනාකරණ ක්‍රමවේද අනුගමනය කරන්න. ප්‍රදේශයේ පශු වෛද්‍යවරයා හෝ සත්ව සෞඛ්‍ය පිළිබඳ විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයින් සමග සාකච්ඡා කොට ගොවිපලෙහි සතුන් රෝගවලින් ආරක්ෂා කර ගැනීම සඳහා සත්ව සෞඛ්‍ය සැලැස්මකට අනුකූලව කටයුතු කරන්න.

6. අදාල රසායනාගාර වාර්තා ද සහිතව ගොවිපලෙහි ප්‍රතිජීවක භාවිතය පිළිබඳ වාර්තා තබා ගැනීමට කටයුතු කරන්න.

@ වැඩිදුර තොරතුරු සඳහා www.oie.int/amrstandards






Funded by UK Government

WORLD ORGANISATION FOR ANIMAL HEALTH
Protecting animals, preserving our future